**ඒකාබද්ධ නිවේදනය**

2021/05/16

## *ශ්‍රී ලංකාව - නඩු නැතිව අවුරුද්දක් රඳවාගෙන සිටින කවියා වහාම නිදහස් කරන ලෙස ඉල්ලා සිටින ඒකාබද්ධ නිවේදනය*

**කිසිම නඩු පැවරීමකින් තොරව අවුරුද්දකට වැඩි කාලයක් දිගටම අත් අඩංගුවේ රඳවා සිටින කිවියර සහ ගුරුවර අහ්නාෆ් ජසීම් සිරගතකොටගෙන සිටීම පහත අත්සන් කරන අප සංවිධානවල බලවත් කනස්සල්ලට හේතුවී තිබේ. අහ්නාෆ් ජසීම් වහාම නිදහස් කරන ලෙස ශ්‍රී ලංකාවේ බලධාරීන්ගෙන් ඉල්ලා සිටින අපි, නොඑසේ නම්, ඔහුට එරෙහිව ජාත්‍යන්තර වශයෙන් පිළිගත හැකි අපරාධ චෝදනා කඩිනමින් ගොණුකොට ජාත්‍යන්තර සාධාරණ විනිශ්චයේ ප්‍රමිතීන්ට අනුකූලව නඩු පවරන ලෙස ඉල්ලා සිටිමු.**

විසිහය හැවිරිදි කවියකු සහ ලේඛකයකු වන අහ්නාෆ් ජසීම් (ලේඛන නාමය, මන්නාරමුදු අහ්නාෆ්) ශ්‍රී ලංකාවේ රුදුරුතර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ අත් අඩංගුවට ගන්නා ලද්දේ 2020 මැයි 16 දාය. අත් අඩංගුවට ගැනීම සිදු කරන ලද්දේ ඔහු විසින් 2017 දී ලියා පලකළ නවරසම් (*நவரசம்*) දෙමළ පද්‍ය සංග්‍රහය ගැන සහ සිය ශිෂ්‍යයන් 'අන්තවාදී මතවාදවල' අනුගාමිකයන් බවට පත් කිරීමේ අභිලාෂයෙන් ඔවුන් 'අන්තවාදී' කරුණුවලට නිරාවරණය කළ බව කියා පාමිනි. ඔහු අත්අඩංගුවට ගන්නා ලද්දේ ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව කොන් කිරීම සහ ඔවුන්ට වෙනස්කම් පෑම එන්න එන්නම උත්සන්න වෙමින් පවතින පසුබිමකය.

වාර්තාවන පරිදි ශ්‍රී ලංකාවේ බලධාරීන් *නවරසම්* පිටපත් සොයාගත්තේ පාස්කු බෝම්බ ප්‍රහාර හා සම්බන්ධ බවට සැක කොට විමර්ශනය කෙරෙන පාසලක තිබී ය. එය ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලයේ ලැයිස්තු ගතකොට ඇති, කිසිවිටෙක තහනමට ලක් නොකළ පොතක් වුවත්, අහ්නාෆ් ජසීම් රඳවා තබන්නට බලධාරීන් තීන්දු කළේ එහි ඇතුලත් කරුණු සහ වෙනත් හේතු දක්වමිනි.

*නවරසම්* හි අඩංගු වන දෑ අන්තවාදයට උල්පන්දම් දෙන බවට ශ්‍රී ලංකාවේ බලධාරීහු දිගින් දිගටම තර්ක කරමින් සිටිති. කෙසේවෙතත්, එම චෝදනාව තරයේ ප්‍රතික්ෂේප කරන කතුවරයා සහ ඔහුගේ නීතිඥ සංජය විල්සන් ජයසේකර, රඳවා තබාගැනීම දකින්නේ 'මුස්ලිම් විරෝධී ජාතිවාදය මුල් බැස්සවීම අරමුණු කොට ගත්තක්' ලෙසිනි. අහ්නාෆ් ජසීම් ගේ කවියට බලධාරීන් දෙන නිර්වචනය අභියෝගයට ලක් කරන කීර්තිමත් දෙමළ භාෂා මහාචාර්යවර මක්බූල් අලිමොහමඩ් නුහුමාන් පවසන්නේ

“අන්තවාදයට, ප්‍රචණ්ඩතාවට සහ යුද්ධයට එරෙහි කවිපන්ති කිහිපයක්ම මෙම කාව්‍ය සංග්‍රහයේ ඇත,” යනුවෙනි. ජසීම්ගේ කවි අන් අය ප්‍රචණ්ඩතාව සඳහා පොළඹවන කිසිදු අභිප්‍රායක් පල නොකරන බව පහත අත්සන් කරන අපගේ පිළිගැනීමයි.

ඔහුගේ නීතිඥවරයා පවසන පරිදි, අහ්නාෆ් ජසීම් රඳවා තබා ඇත්තේ කුරිරු, අමානුෂික සහ අවමාන සහගත සැලකිල්ලක් ගණයේ ලා ගිණිය හැකි නින්දිත තත්වයක් යටතේය. එය ඔහුගේ සෞඛ්‍යය පිරිහීමට හේතුවී තිබේ. මීට අමතරව, ජසීම් රඳවා තබා සිටින කාලය තුල ඔහුට හිමිවිය යුතු නිසි කාර්ය පටිපාටිය බලධාරීන් විසින් උල්ලංඝනය කර තිබේ. ප්‍රශ්න කරමින් සිටියදී ජසීම්ට අසත්‍ය පාපොච්චාරණ දීමට බලකොට, නොදන්නා භාෂාවකින් ලියැවුණු ලියවිලි වලට ඔහුගෙන් බලහත්කාරයෙන් අත්සන් ලබාගත් බව ජසීම්ගේ නීතිඥයා පවසයි. අත්අඩංගුවට ගත්දා සිට මාස දහයකට ආසන්න කාලයක් ජසීම්ට නීතිඥ සහාය ලබාගැනීමේ අවස්ථාව වලකා, ඊට ඉඩකඩ ලබාදුන් විට, නීතිඥවරයා සහ සේවාදායකයාට හිමි වරප්‍රසාද යටතේ සිදුවන සාකච්ඡා බලධාරීන් විසින් පටිගත කොට තිබේ. ඔහුගේ ඥාතීන්ට අහ්නාෆ් ජසීම් හමුවන්නට අවස්ථාව සලසා දී ඇත්තේ ද රඳවා තබාගෙන මාස පහක් කල් ගතවූ පසු ය.

අහ්නාෆ් ජසීම් රඳවා තබාගෙන අවුරුද්දක් ගතවුනත්, ඔහුට එරෙහි චෝදනා සනාථ කරන කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කිරීමට බලධාරීන් සමත් වී නැත. ජසීම් ජාත්‍යන්තර වශයෙන් හඳුනාගන්නා ලද අපරාධයක් කළ බවට විශ්වසනීය සහ පිළිගත හැකි සාක්ෂි බලධාරීන් සතු වේ නම්, ඔහුට විරුද්ධව ඔවුන් වහාම චෝදනා ගොනු කොට සිය නිර්දෝෂී භාවය ඔප්පු කිරීමට අවස්ථාව සැලසෙන පරිදි ඔහුට නිසි ක්‍රමවේදය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සාධාරණ නඩු විභාගයකට මුහුණ දීමේ අයිතිය සහතික කර දිය යුතු ය. එවන් සාක්ෂි නැති කල්හි ඔවුන් කළ යුත්තේ වහාම ඔහු නිදහස් කිරීම ය.

අහ්නාෆ් ජසීම් රඳවාගෙන සිටින්නේ චෝදනා ගොනු කිරීමකින් හෝ නඩු පැවරීමකින් තොරව කිසිදු චෝදනාවක් නැති පුද්ගලයන් දහඅට මාසයක් දක්වා අත්තනෝමතික ලෙස රඳවා තබාගත හැකි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ ය. බලහත්කාරයෙන් පාපෝච්චාරණ ලබාගැනීම සඳහා වධහිංසාව ඇතුළු වෙනත් ආකාරයේ නොමනා සැලකිලි යොදාගැනීම ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාශය (CTID) විසින් පුළුල් ලෙස කෙරෙන්නකි. ශ්‍රී ලංකාවේ වාර්ගික හා ආගමික සුළුතරයට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදාගෙන තිබෙන අතර වාර්ගිකත්වයට සමානුපාතික නොවන දෙමළ හා මුස්ලිම් පිරිසක් එම පනත යටතේ රඳවා තබා තිබේ.

එම පනත අහෝසි කර දමන ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ මානව හිමිකම් සංවිධාන දිගින් දිගටම ඉල්ලීම් කර තිබුණත් ශ්‍රී ලංකාවේ අනතුරට භාජනය වීමේ වැඩිම අවදානමක් ඇති ජන කොටස්වලට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත බලධාරීන් විසින් දිගටම යොදාගනිමින් පවතී.

**අහ්නාෆ් ජසීම් වහාම නිදහස් කරන ලෙස ශ්‍රී ලංකාවේ බලධාරීන්ගෙන් ඉල්ලා සිටින අපි, නොඑසේ නම්, සාධාරණ නඩු විභාගයක ඔහුගේ නිර්දෝෂී භාවය ඔප්පු කරන්නට ඉඩ සලසා දීම සඳහා චෝදනා ගොනු කරන ලෙස ශ්‍රී ලංකාවේ බලධාරීන්ගෙන් ඉල්ලා සිටිමු. එමෙන්ම, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ සුළුතර ජනයාට එරෙහිව මානව හිමිකම් උල්ලංඝනය කිරීමට මග පාදන බරපතල දෝෂසහගත ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) වහාම අහෝසි කරන ලෙස ඉල්ලා සිටිමු.**

**අත්සන් කළේ:**

- පෙන් ජාත්‍යන්තරය (PEN)
- ඇම්නස්ටි ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය (AI)
- ශ්‍රී ලංකාවේ සාමය හා යුක්තිය සඳහා ව්‍යාපාරය (SLC)
- ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදියෝ (JDS)
- ශ්‍රී ලංකාව පිළිබඳ ක්‍රියාකාරී සංවිධානය (IWG)
- ශ්‍රී ලංකාවේ සත්‍යය හා යුක්තිය සඳහා ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP)
- යුක්තිය හා වගවීම සඳහා මධ්‍යස්ථානය (CJA)

- ජාත්‍යන්තර යුක්තිය සඳහා ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය (ACIJ)
- Article 19
- Human Rights Watch
- IMADR
- PEARL
- Freemuse

*වැඩිදුර විස්තර සඳහා Ross Holder, Asia Programme Coordinator at PEN International, Unit A, Koops Mill, 162-164 Abbey Street, London, SE1 2AN, Tel.+ 44 (0) 20 7405 0338, email: ross.holder@pen-international.org*